# පෙරවදන

ශ්‍රී ලංකා ජාතික ව්‍යාපාරය සහ ප්‍රජාතන්ත්‍රීය සංවිධාන ව්‍යවස්ථාදායක සහා නියෝජනයේදී කුල ක්‍රමය සමග පැවැත්වූ අන්තර් සම්බන්ධතා පිළිබඳව විමසීමක් මැයෙන් රචිත මෙම නිබන්ධය පරිච්ඡේද පහකින් හා සමාලෝචනයකින් සමන්විත වේ. පළමුවැනි පරිච්ඡේදය හැඳින්වීම සඳහා වෙන් කොට ඇති අතර එමගින් ගැටලුව, ක්‍රමවේදය සහ මූලාශ්‍ර පිළිබඳව පෙන්වා දෙනු ලබයි.

දෙවැනි පරිච්ඡේදයෙන් දේශපාලන සංවිධාන හා සංයුතිය පිළිබඳව විස්තර කෙරේ. තෙවැනි පරිච්ඡේදයෙන් කුල ක්‍රමය හා දේශපාලන ක්‍රියාවලිය මෙන්ම දේශපාලන සංවිධාන තුළ කුල හැඟීම් ක්‍රියාත්මක වූ ආකාරය විමසීමකට ලක් කෙරේ. සිව්වැනි පරිච්ඡේදය මැතිවරණ කොට්ඨාශ වෙන් කිරීමේදී කුල ක්‍රමයට දැක්වූ සැලකිල්ල හා මැතිවරණවලදී කුල ක්‍රමයේ බලපෑම පිළිබඳවත් මැතිවරණවලින් ඉස්මතුවන කුල පදනමත් විමර්ශනයට භාජනය කරනු ලබයි. පස්වැනි පරිච්ජේදයෙන් ප්‍රජාතන්ත්‍රීය සංවිධාන හා ව්‍යවස්ථාදායක සභා නියෝජනය සම්බන්ධයෙන් කුල ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳ විමසුමට ලක් කෙරේ.

මෙම ශාස්ත්‍රීය නිබන්ධය සම්පාදනය කිරීම සඳහා අධ්‍යයනයේ නිරත වූයේ රුහුණ විශ්වවිද්‍යාලයේ ඉතිහාස අධ්‍යයනාංශයේ හිටපු මහාචාර්ය එම්. යූ. ද සිල්වා මැතිතුමාගේ මාර්ගෝපදේශකත්වය යටතේය. වර්තමානයේ ඉතිහාස අධ්‍යයනාංශය සතු සම්පතක් නොවූවද, එතුමාගේ දැනීම සීමාවකින් තොරව නොපැකිලව නොඅඩුව මා හට ලැබීම කෘතියේ තත්ත්වය උසස් කර ගැනීමට විශාල පිටුබලයක් විය. එබැවින් එතුමන්ගේ වටිනා කාලය මා වෙනුවෙන් විඩංගු කර දැක්වූ කැපකිරීම හා පරිත්‍යාගශීලීභාවයට පළමු කොටම මාගේ උපස් කෘතවේදී ස්තුතිය පුද කරමි. දෙවනුව මෙම අධ්‍යයන කාර්යයේදී පියෙකු මෙන් මා නිරතුරුවම ධෛර්යමත් කරමින් පශ්චාත් උපාධි අධ්‍යයනයකදී මුහුණ පෑමට සිදුවන්නා වූ ගැටලුවලදී උපදෙස් දෙමින් හෘදයාංගමව සහාය ලබාදුන් ඉතිහාස අධ්‍යයනාංශයේ අංශාධිපති මහාචාර්ය සුමනසිරි වාච්චගේ මැතිතුමාට ද මාගේ කෘතඥතාවය හිමි වේ.

මේ අධ්‍යයන කාර්යයේදී වාචික තොරතුරු හා පොත පත සපයා ගැනීමේදී සහාය දුන් අපවත් වී වදාළ රූකව ජයමහා විහාරයේ විහාරාධිපතිව වැඩවිසූ පූජ්‍ය ශීලානන්ද හිමියන්, පූජ්‍ය බ්‍රාහ්මණවත්තේ ධම්මික ස්ථවිරයන් සහ මා හිතවත් ආචාර්ය මිරැන්ඩෝ ඔබේසේකර සූරින්, වැලිතර ඒ රණසිංහ සිරිමතුන් සහ රුහුණු විශ්වවිද්‍යාලයීය පුස්තකාලයේ ලංකා ශාලාවේ යූ. ඒ. පියසේන මහතා හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති ඒ. ටී. අල්විස් යන මහත්වරුන්ට ද මාගේ ප්‍රණාමය පිරිනමමි. එමෙන්ම ඉංග්‍රීසි වාර්තා පරිවර්තනයේදී ගැඹුරු තැන් සරල කර ගැනීමට මට සහාය දැක්වූ හැරල්ඩ් නානායක්කාර සුධීන්ට ද මාගේ හදපිරි ස්තුතිය පුදකරමි.

මේ හැර මේ ශාස්ත්‍රීය කටයුත්තේදී විවිධ අයුරින් මට උපකාර වූ ජ්‍යෙෂ්ඨ කථිකාචාරිනි කාන්ති ජයසිංහ මහත්මිය. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය එම්. වී. චන්ද්‍රසිරි මහතා ඇතුළු ඉතිහාස අධ්‍යයනාංශයේ සහෝදර ඇදුරු මඬුල්ල ද ස්තුති පූර්වකව සිහිපත් කරමි. නිතරම මා ගත දැවටෙමින් සුරතල් කරන ලෙස ඇවිටිලි කරන රත් බේබි දුව හා රත් පුතා ඇකයට ගනිමින් මේ ශාස්ත්‍රීය කර්තව්‍යයට ඉඩ හසර ලබා දෙමින් සදාදර බිරිඳ නිබඳවම මා දිරිමත් නොකරන්නට මෙය තවත් ප්‍රමාද වන්නට ඉඩ තිබිණි. ඒ වෙනුවෙන් ඇයට බොහෝ තුති හා පින් ප්‍රාර්ථනා කරන අතර පරිගණක අක්ෂර සංයෝජනයෙහිලා සහාය දුන් සහකාර කථිකාචාර්ය චාමින්ද බණ්ඩාර, ශිෂ්‍ය අසංක සම්පත් හා දුමිඳු නුවන් රංග කලෙහෙවත්ත යන මහතුනට සහ අමිලා ශාන්ති හා නදීරා මෙනවියන්ට ද මාගේ කෘතගුණ පූර්වක ස්තුතිය පිරිනමනු කැමැත්තෙමි.